# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**සංඛ්‍යාලේඛන නිලධාරී තනතුර තනතුර සඳහා බඳවා ගැනීම (බාහිර )**

ඉහත තනතුර සඳහා සුදුසුකම් ලත් බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. රැකියා විස්තරය සහ වගකීම්

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අවශ්‍යතා අනුව, විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ දත්ත එකතු කිරීම, ඒවා සංවිධානය කිරීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රචාරය කිරීම සිදු කිරීම.
2. සමීක්ෂණ සහ සංඛ්‍යානමය අධ්‍යයන සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
3. දත්ත සමුදා සහ තොරතුරු ගබඩා සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම.
4. සංඛ්‍යාන වාර්තා සහ ප්‍රකාශන සකස් කිරීම.
5. තීරණ ගැනීම සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු කාලෝචිතව ලබාදීම මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකාරිත්වයට සහාය වීම.

## 2. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, සංඛ්‍යාන විද්‍යාව හෝ ගණිතය විෂයය සහිත උපාධියක් ලබා තිබීම .

සහ

දත්ත සහ සංඛ්‍යාත්මක තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ බෙදාහැරීම පිළිබඳ අවම වශයෙන් වසර 03ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

## 3. බඳවා ගැනීමේ පටිපාටිය

ලිඛිත තරඟ විභාගය, ප්‍රායෝගික පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් ලබාගන්නා කුසලතා ප්‍රතිඵල පදනම් කරගෙන බඳවා ගැනීම් සිදු කෙරේ.

තරඟ විභාගය, ප්‍රායෝගික පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් ලබාගන්නා සමස්ත ලකුණු එකතුව මත පදනම්ව, සුදුසුකම් අනුව පමණක් පත්වීම් සිදු කරනු ලැබේ.

ලිඛිත විභාගයේ විෂයයන්:

අ) භාෂා ප්‍රවීණතාවය සහ හැකියා පරීක්ෂණය – පැය 2 – ලකුණු 100
ආ) තනතුරට අදාළ විෂය දැනුම – පැය 2 – ලකුණු 100

### 3.1 ප්‍රායෝගික පරීක්ෂණය: :

මෙම පරීක්ෂණයේ අරමුණ වන්නේ අපේක්ෂකයාගේ විෂය දැනුම සහ කුසලතා ප්‍රායෝගික තත්ත්වයකදී භාවිතා කිරීමේ හැකියාව ඇගයීමයි. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ සිද්ධාන්තයක් හෝ අත්දැකීමක් (case / experience) ලබාදෙන අතර, නියමිත කාල සීමාව තුළ අපේක්ෂකයා ලබාදෙන ප්‍රතිචාරය ඇගයීමට ලක් කරනු ලැබේ.

බඳවා ගැනීමේ විභාගය සමත් වීම සඳහා, එක් එක් විෂයයට නියමිත ලකුණු වලින් අවම වශයෙන් 40%ක් සහ සමස්ත ලකුණු එකතුවෙන් අවම වශයෙන් 50%ක් ලබාගත යුතුය.

**4. වැටුප් පරිමාණය :**

(1) TRC 4.1 - 118,239 - (10x2112)-(10x2816)-(10x3519) -(10x4223)-244,939

**5. වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු.18-45 අතර විය යුතුය.

**6. පොදු කොන්දේසි :**

**6.පොදු කොන්දේසි:**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා ඍජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය

**7. අයදුම් කිරීමේ ක්‍රමය :**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk වෙතින් බාගත කරගත හැකිය..
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2026.06.01 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සංඛ්‍යාලේඛන නිලධාරී තනතුරට බඳවා ගැනීම (බාහිර) යනුවෙන් සඳහන් කළ යුතුය.**
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lkවිද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව **" සංඛ්‍යාලේඛන නිලධාරී තනතුරට බඳවා ගැනීම (බාහිර) - 2026"** විය යුතුය.
7. රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් **2026.06.01** දින හෝ එදිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක . 276, ඇල්විටිගල මාවත
කොළඹ 08

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

සංඛ්‍යාලේඛන නිලධාරී තනතුර සඳහා අයදුම්පත්‍රය (බාහිර )

1. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන් ) :මහතා ./ මහත්මිය ./ මෙනවිය ………………………………………………

2. සම්පූර්ණ නම ( ඉංග්‍රීසියෙන් ) : ………………………………………………………………………

3. සම්පූර්ණ නම ( සිංහලෙන් / දෙමළින්) :…………………………………………………………………..

4. ලිපිනය : ……………………………………………………………………

5. උපන් දිනය :…………………….. 2026 . 05.25 දිනට වයස : …………………………

6. දුරකථන අංකය .: ………………………

7. විද්‍යුත් තැපැල් ලිපිනය ……………………………………..

8. ජාතික හැඳුනුම්පත් අංකය : ………………………………………………..

9. ස්ත්‍රී/ පුරුෂ භාවය : ……………………………………………

10. අධ්‍යාපන සුදුසුකම් : ……………………………………………………………………

11.වෘත්තීය සුදුසුකම් : ……………………………………………………………………

12.සේවා පළපුරුද්ද …………………………………………………………………………

13. ඔබ රජයේ සේවයේ නියුක්ත නම්:

ආයතනය : ……………………………………………………….

තනතුර : ……………………………………………………..

14. අමුණා ඇති සහතික පිටපත්

1 ……………………………………………………………………

2.……………………………………………………………………

3.……………………………………………………………………

4.……………………………………………………………………

15. අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය සහ නිවැරදි බව මම ගෞරවයෙන් ප්‍රකාශ කරමි. මෙම අයදුම්පතේ කිසියම්

තොරතුරක් අසම්පූර්ණව හෝ වැරදි ලෙස ඉදිරිපත් කිරීමෙන් ඇතිවිය හැකි ඕනෑම ප්‍රතිඵලයක් සඳහා වගකීම භාර ගැනීමට මම එකඟ වෙමි. තවද, මෙම අයදුම්පතෙහි සඳහන් සියලු

කරුණු මාගේ දැනුම අනුව නිවැරදි බවද මම සහතික කරමි.

දිනය : ……………………… අයදුම්කරුගේ අත්සන : ……………………………………..

16. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සඳහා)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන
………………………………………………………………… මහතා/මහත්මිය/ මෙනවිය
…………………………………………… තනතුරේ සේවය කරමින් සිටින අතර, ඔහුගේ/ඇයගේ සේවය සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහු/ඇයට එරෙහිව කිසිදු විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, අනාගතයේදී එවැනි ක්‍රියාමාර්ගක් ගනු ලබන බවට තීරණය කර නොමැති බවත් මම මෙයින් සහතික කරමි. තවද, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම ආයතනයේ සේවයෙන් මුදාහැරිය හැකි / නොහැකි බව මෙයින් දැනුම් දෙමි.

දිනය : ………………………

නම : ........................................................................................................................................

තනතුර : - ..................................................................................................................................

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව /ආයතනය : -
……………………………………………………………………

නිල මුද්‍රාව :